ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2015 පෙබරවාරි 02 සඳුදා
07 වෙළුම - 14 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 21/ News/ 2015




ඡායාරූපය : ධම්මි සුභාෂිනී

# පුංචි අපිත් අභිමානයෙන් 'නිදහස් දිනය' සමරමු !

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# නිදහස් ශ්‍රී ලංකාවක කතෝලික අපගේ උරුමය

## ආදරණීය දුවේ පුතේ...

අපි එකම ජාතියක් හැටියට අප උපන් මේ මාතෘ භූමියේ සෛවරී භාවයට, ස්වාධීනත්වයට, භෞමික අඛණ්ඩතාවයට හා නිවහල් බවට නිරන්තරයෙන්ම ගරු කළ යුතු පිරිසක් බව අමතක කරන්න එපා. මේ දිනවල 65 වන නිදහස් සමරුව පවත්වන්නට මුළු දේශයම එකට පෙළ ගැසෙන බව අපි කවුරුත් දන්නවා. එය පැහැදිළිව අපට පෙනෙන්නට තිබෙනවා. ශ්‍රී ලංකා ධජය සෑම ප්‍රසිද්ධ තැනකම, නිවසකම මේ දිනවල ඔසවලා තිබෙන බව දකින්නට පුළුවන්. දේශාභිමාන ගීත සහ ශ්‍රී ලාංකේය ජාතියක් හැටියට දේශයට ආදරය කරන්නට ජනතාවක් පෙළ ගස්වන්නට සෑම තැනකම වැඩ සටහන් සම්පාදනය වෙන බවත් අපි දකිනවා.

ආදර දුවේ පුතේ, කිසිම රටක ආගම නිසා ජාතියට ඇති ආදරය, භූමියට ඇති ආදරය අඩු වැඩි වෙන්නට බැහැ. එක සමානව සෑම පුරවැසියෙක්ම උපන් දේශය තුළ තමන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව හොඳ හඳුනාගැනීමකින් හා පිළිගැනීමකින් ජීවත් විය යුතුයි. ඉතිං මේ ලංකාද්වීපය තුළ උපන් අපිත් ශ්‍රී ලාංකිකයන් හැටියට මේ උරුමය තුළ සැදී පැහැදි ජීවත් වන්නට ඕනා. අදහන ආගම නිසා රටේ දෙවන පංතියේ පුර වැසියන් සේ ජීවත් වන්නට අවශ්‍ය වන්නේ නැහැ. රටේ ප්‍රධාන ආගම හැටියට බුද්ධාගම තුළ වැඩි ජනතාවක් තමන්ගේ විශ්වාස පද්ධතිය රඳවා ඒ තුළ දේශයට ආදරය කරනවා වගේම කතෝලික අපිත් අපේ විශ්වාස පද්ධතිය රකින අතරම උපන් දේශයේ පුතුන්, දියණියන් සේ දේශයේ උන්නතියට, දියුණුවට ඇප කැප වෙමින් එයට ආදරය කරමින්, එය රැක ගනිමින් ජීවත් වන්නට ඕනා. මෑත අතීතය තුළ කතෝලික අපේ මුතුන් මිත්තන් මේ දේශයේ නිදහස වෙනුවෙන් බොහෝ කැපවීම් කළා. විදේශ ආධිපත්‍යයට නතු වෙලා තිබුනු අප දේශය මුදා ගන්නට එවකට කතෝලික ශ්‍රී ලාංකික ජනතාව අපරිමිත සේවයක් ඉටු කළා. අභාග්‍යයකට , අද සමහර ඉතිහාස කථා වල මෙය සඳහන් වන්නේ නැහැ. නමුත් අපේ යුතුකමක් තිබෙනවා, මේ දේශයට පණ මෙන් ආදරය කළ, දේශයේ උන්නතිය වෙනුවෙන් මහ පුජා වීමකින් කටයුතු කළ කතෝලික අපගේ විරුවන් වෙනුවෙන් කථා කරන්න. ඔවුන් සිහිපත් කරමින් නිදහස පිළිබඳව කථා කරන මේ කාල වකවානුවේ ඔවුන්ගේ ආත්මයන් වලට නිත්‍ය සුව ප්‍රාර්ථනා කරන්නට.

ආදර දුවේ පුතේ, නිදහස් සටන ආරම්භ කරන්නට මුල පිරුවේ 1919 දෙසැම්බර් මාසයේ පිහිටුවන ලද ''ලංකා ජාතික සංගමය''යි මේ සංගමයේ පළමු සභාපති වරයා බවට පත්වූයේ ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමායි. ඔහුට පසුව (1920 නොවැම්බර් 18 වන දින) එම තනතුරට පත්වූ ක්‍රිස්තු භක්තික ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ලංකා ජාතික සංගමයේ සභාපතිධුරය හිමිකරගත් පළමු සිංහලයා වුනා. ජාතික සංගමය පළමු වරට (ක්‍රි.ව. 1918-1920) පත් කරගත් සහ ලේකම්වරු දෙදෙනා අතර ඊ.ටී. ද සිල්වා මහතා බැතිමත් කතෝලිකයෙක්. ඔහු එහි භාණ්ඩාගාරික ධුරය දැරූ පළමුවැන්නාද වුනා. ජාතික සංගමයේ දෙවන වසරේදී එහි එක් ලේකම්වරයකු හැර අන් ප්‍රධාන නිල සියල්ලම ඉසිලුයේ ක්‍රිස්තු භක්තිකයන් විසිනුයි. ප්‍රැන්සිස් ද සොයිසා (1925-1926), ඊ.ඩබ්ලිව් පෙරේරා. (1926 -1927) , පී.සී.එස්. (ශ්‍රීමත් ක්ලෝඩ්) කොරෙයා (1932 සිට 1942 දක්වා තුන්වතාවක්), ජෝර්ජ් ඊ.ද. සිල්වා (නොකඩවා හය වසරක්) මේ ජාතික සංගමය තුළ ක්‍රියා කාරි වුණා. 1917 දී බිහිවූ ''ලංකා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩලයේ'' ප්‍රතිඵලයක් ලෙස බිහිවූ ''ලංකා ජාතික සංගමය'' නිදහස ලබා ගැන්මට ඉටුකළ පුරෝගාමී මෙහෙවරේ ප්‍රධානතැනක් ඉසුලුවේ ක්‍රිස්තියානි බැතිමතුන් බව අපි නිරන්තරයෙන්ම සිහිපත් කළ යුතුයි. දේශිය කතෝලිකයා කවදත් මේ දේශයට තදින්ම ආදරය කරන්නෙක්. ඒ ආදරය නිසාම හැම ජාතියකම, හැම ආගමකම සහෝදර පිරිස් වෙත සහෝදරත්වයෙන් හැරෙන්නට කතෝලිකයා හට ශක්තියක් තිබෙනවා. මේ දේශය තුළ අපි සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හැටියට ජාතින් වශයෙන් වෙන්වී උපත ලැබුවත් එක මවකගේ දරු කැලක් සේ මේ මාතෘ භූමියේ පහස ලැබිය යුතුයි. විශ්වාසය තුළ බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාම් වුවත් ඒවායේ වටිනාකම් තුළ පෝෂණය වී දේශය තුළ එහි මිනිස් කමේ හැඟීමට උරදී ජීවත් විය යුතුයි. මේ දේශය තුළ දැයේ දූ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගන්නට පාඨශාලා ඇතිකර ඒ අධ්‍යාපනය සඳහා පෙරමුණ ගත්තේ ක්‍රිස්තියානි පූජක පරපුරයි. ඒ සඳහා කතෝලික සභාව ඉටු කළ මෙහෙවර අති විශිෂ්ටයි. ඒ කැපවීම නිසාම ලෝකයේ ඕනෑම තැනක නොබියව ප්‍රඥාව තුළ ශ්‍රී ලංකා දේශයේ නම රඳවන්නට අපේ ශ්‍රී ලාංකේය ජනතාවට ශක්තියක් ලැබී තිබෙනවා.

ආදර දුවේ පුතේ, ජාති හැඟීමක් නිසා ආගම් විරෝධයක් නිසා මේ දේශය තුළ ජීවත් වන එකම සහෝදර ජනතාවක් විරසක වෙනවා නම් එය මහා බරපතළ අභාග්‍යයක්. ගෙවුනු තිස් වසර තුළ එකම දේශයේ ජිවත් වන සහෝදර ජනතාව යුද්ධ කළ හැටි සිතන්නට ලැජ්ජයි, දුකයි. ඒවා සිදු නොවිය යුතු දේවල්. දේශීය කතෝලික ජනතාව ශ්‍රී ලංකා දේශයේ උපන් භූමි පුත්‍රයන් ලෙස ජාතින් හැටියට බෙදෙන්නෙ නැතිව, ආගම් හැටියට බෙදෙන්නෙ නැතිව අතීතයේ සිට අද දක්වා සාමකාමිව ජිවත් වනවා. එය අප දැයට දායාද කළ ඉතා උතුම් දයාදයක්. ඒ සහෝදරත්වය, නිවහල්ව, සෛවරීව අපි සැම දෙනාම අත් විඳින්ට අවශ්‍යයි. ජාති හැඟීමක් හෝ ආගම් හැඟීමක් තුළ විරසක නොවන තත්ත්වයක් මේ දේශයේ තිබිය යුතුයි. එකිනෙකා එකිනෙකාට ගරු කළ යුතුයි. ආදරය කළ යුතුයි. ඒ හැඟීමෙන් 67 වන නිදහස උපරිමයෙන්ම සමරන්නට අපි හැම කෙනා සමඟම අත්වැල් බැඳගනිමු.

**ශ්‍රී ලංකා මාතාව දිනේවා !**

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# යොවුන් ආදරය පිළිබඳ කිතුනු දැක්ම

වර්තමාන සමාජය තුළ ආදරය යන්න හුදෙක් වචනයට පමණක් සීමාවූ දෙයක් බවට පත්වී තිබේ. ආදරය යන වදන දෙසවනට වැකෙත්ම යම් අයෙකුට චමත්කාර ජනක, ආනන්දනීය හැඟුමන් සිතෙහි උපදින්නට පුළුවන. එහෙත් තවත් අයෙකුට අම්හිරි, වේදනාකාරී ගැටලු සහගත හැඟුම් සමුදායක් සිතෙහි නිර්මාණය වීමට පුළුවන. කෙසේ වුවද ආදරය වූ කලි ඉතා පුළුල්, ගැඹුරු, භාවපූර්ණ සංකල්පයකි. එපමණක් නොව එය අද්විතීය දෙයක්ද වන්නේය. මෙහි එක් ක්ෂේත්‍රයක් වශයෙන් යොවුන් අවධියේඇති වන්නාවූ ලිංගික ආකර්ෂණ ය පෙරටු කොට ගැනීමෙන් මතුවන ප්‍රේමය සඳහන් කළ හැක. එකිනෙකා අතර විවිධා කාර ආදර සම්බන්ධතා පවතින අතර එක් එක් ආදර සම්බන්ධතාවන් එකිනෙකාට සාපෙක්ෂවේ. පුද්ගල බද්ධවේ. එමගින් ලිංගික ආකර්ෂණ යෙන් බැහැරවූ පොදු වශයෙන් විස්තර කළ හැකි ආදරය පිළිබඳව සාකච්ඡාවේ.



සැබෑ ගැඹුරු ආදරයක පදනම විය යුත්තේ පුද්ගලයාගේ බාහිර පෙනුමට වඩා අභ්‍යන්තර ගුණාංග වල පවත්නා ආකර්ෂණය විය යුතුය. හුදෙක් පිටස්තර අංග ලක්ෂණ පමණක් මූලික කොටගෙන ඇතිවන ආදරය හුදෙක් දිය මත ඇඳි ඉරක් සේය. අස්ථිරය. ආශාවන්, පටු හැඟීම් මුල් කොට ගෙන ඇතිවන යොවුන් ආදරය පදනම් විරහිතරය. ඒ නිසා ප්‍රේමයේ නිකලැල් බව සුරැකිය යුතුය.

මානව පරපුර කෙරෙහි ආදරය මුල් කරගනිමින් බලන්නට අවස්ථාව ලැබෙන්නේ ඒ හෙයිනි. දෙදෙනෙක් අතර ලිංගික පෙළඹවීමකින් යුතුව හටගන්නා ආදරය ඉහත සඳහන් කළ ආදර සම්බන්ධතා වලට වඩා වෙනස් වන බව තේරුම් ගත යුත්තකි. එය ආරම්භය සම්බන්ධ යෙන් ශුද්ධවූ බයිබලය සාක්ෂි දරයි. ආදරය ආරම්භ වූයේ කෙලෙසදැයි කිසිවෙක් දන්නේ නැත. මිනිසාගේ ආරම්භය පිළිබඳව විස්තරයට අනුව එවන් ආදරයක් නිර්මාණය වීම දෙවියන් වහන්සේගේ සැලසුම් ප්‍රකාර අද්විතීය සැලැස්මක් බව පෙන්වා දීමට පුළුවන. ස්ත්‍රිය හා පුරුෂයා තම දෙමාපියන් අතහැර ඔවුන් එකිනෙකාට ආදරය කිරීමට යොමුවන බව ශුද්ධ වූ බයිබලයෙහි දැක්වේ. ප්‍රථම මනුෂ්‍යයා වන ආදම්ව තද නින්දකට පත්කොට ඉල ඇටයක් ගෙන ඊට මාංශය පුරවමින් ස්ත්‍රිය මැවූ බව ශුද්ධ වූ බයිබලය තුළ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත.

එහිලාදෙවිඳුන්ගේ මැවිල්ලෙහි ප්‍රථම ආදර ගීතය ගැයීය. ස්ත්‍රීන් සහ පුරුෂයා අතර ගැඹුරු ප්‍රේමයක් සඳහා මුල පිරීය. පුරුෂයාගේ ඉල ඇට යකින් ස්ත්‍රිය සකස් කර තිබෙන හෙයින් එම ක්‍රියාවලිය තුළ පුරුෂයාගේ මාංශය හා රුධිරයෙන් ස්ත්‍රිය සෑදු අන්දම මෙමගින් ගම්‍ය වන්නකි. පුරුෂයාගේම කොටසක් ලෙස ස්ත්‍රිය හඳුන්වා දීමට පුළුවන. ස්ත්‍රියට මනුෂ්‍ය දූ යැයි ප්‍රකාශ කළේ ඒ නිසාය. ස්ත්‍රිය හා පුරුෂයන් අතර පවත්නා නෑඹුරුවට හේතුව එය ලෙස අපට වැටහේ. එය දේව වචනය තුළින්ද තහවුරු කෙරේ.

සැබෑ ගැඹුරු ආදරයක පදනම විය යුත්තේ පුද්ගලයාගේ බාහිර පෙනුමට වඩා අභ්‍යන්තර ගුණාංග වල පවත්නා ආකර්ෂණය විය යුතුය. හුදෙක් පිටස්තර අංග ලක්ෂණ පමණක් මූලික කොටගෙන ඇතිවන ආදරය හුදෙක් දිය මත ඇඳි ඉරක් සේය. අස්ථිරය. ආශාවන්, පටු හැඟීම් මුල් කොට ගෙන ඇතිවන යොවුන් ආදරය පදනම් විරහිතරය. ඒ නිසා ප්‍රේමයේ නිකළැල් බව සුරැකිය යුතුය.

**මලින්ත බෝපෙආරච්චි**

# "ලොව සරසන ජේසුගේ මල් වෙමු පුංචි අපි"



කිතුනු විශ්වාසය පෙරදැරි කරගෙන දෙවිඳුන් ඉදිරියේ සාක්ෂි දරන දේව දරුවන් වන අපට දෙවියන් වහනසේ ලබා දී තිබෙන වරප්‍රසාද බොහෝය. ශු. සභාව අප හට උගන්වන දේව පණත් තුළ සාක්ෂි දරමින්, ප්‍රසාද නිධාන ලබා ගනිමින්, කිතුනු දිවියේ හරය අපි ඉගෙන ගනිමු. ලොව ආරම්භයේ දෙවියන් වහන්සේ ලෝකය දින 6 ක් තුළ සම්පූණ කොට සත්වන දවස ශුද්ධවූ දවසක් ලෙස නම් තැබූ සේක. (උත් 2:1-3) උන්වහන්සේගේ මැවීම තුළ උතුම්ම මැවිල්ල වූයේ, මනුෂ්‍යයාය. මෙම උතුම්ම මැවිල්ල මැවීමෙන් අනතුරුව උන්වහන්සේගේ නිර්මාණ ඉතා මනරම් බව දුටු බව ශු. බයිබලය අපට පෙන්වා දෙයි. (උත් 1:31)

දෙවිඳුන් මැවූ ලස්සන ලෝකයේ සමාජිකයෙකු වන්නට අප සැමට උන්වහන්සේගේ වරප්‍රසාදය ලැබී ඇත. ලැබී ඇති එම වරප්‍රසාදයේ විශේෂත්වය වන්නේ, ප්‍රසාද ස්නාපනය තුළ දේව දරුකමේ උරුමය අප හට ලැබීමයි. ඒ සදාතනික උරුමයක් වීම විශේෂිතයි. මෙම උරුමය ලබා ගත් දින සිට අප ගත කරන්නේ දේව දරුවෙක් ලෙසයි. දේව දරුවාගේ විශේෂත්වය වන්නේ, දෙවිඳුන් කෙරෙහි ගැඹුරු විශ්වාසය කින් යුතුව ආදර්ශමත් කිතුනු දිවියක් ගත කරමින් සාන්තුවර ජීවිතය කරා ගමන් කිරීමයි.

දේව දරුකමේ උරුමය අයිති වූ අපට සමාවදීම නැමති ප්‍රසාද නිධානය තුළ සැබෑ සිත් හැරීමකට යොමු වීමෙන් දෙවිඳුන්ගේ දේව ප්‍රේමය නොහඳුනන අයට කියා දීමට හොඳම අවස්ථාවකි. දේව දරුවන් වන අපට ලොවක් සරසන්නට ශාරීරික පෝෂණය මෙන්ම අධ්‍යාත්මික පෝෂණයක්ද අවශ්‍යයි. එනම් ජීවමාන ජේසුගේ ආදර යේ වචනය (දේව වචනය) සහ උන්වහන්සේගේ ශුද්ධවූ ශරීරයේ සහ රුධිරයේ පෝෂණය අපට අවශ්‍යයි. මෙය තුළින් අප හට ආත්මීක පෝෂණය මෙන්ම ශාරීරික පෝෂණයද ලැබීම අපගේ විශ්වාසයයි. ජේසුව ලබා ගැනීම තුළ අපගේ විශ්වාසය ශක්තිමත් වන්නේ, දිව්‍ය පූජාව තුළ යාගික වීමත්, යාගික වීම තුළ සාක්ෂි දැරීමත් තුළින්ය. අප කුඩාකල සිට ඇති කර ගන්නා දේව විශ්වාසය තුළ විශ්වාසයේ සභාව රැක ගැනීම අපගේ පරම යුතුකමය. අභිවෘද්ධි ආලේපය නැමති ප්‍රසාද නිධානය ලබා ගැනීමෙන් ශුද්ධවූ සභාවේ බර කරට ගෙන කටයුතු කරන බව දෙව් මැදුරේ අප ප්‍රකාශ කළෙමු. විශ්වාසය රැක ගැනීමට දුන් පොරොන්දුව අප ජීවිත තුළ කෙසේ ක්‍රියා කරනවාද කියා අප තේරුම් ගත යුත්තේද අප ජීවිත තුළ තිබන අභියෝග හමුවේය. කිතුනු දරුවාගේ පරම පැතුම විය යුත්තේ අභියෝග හමුවේ ජීවමාන ජේසුව අත්දකීමයි. ජීවමාන ජේසු ඉදිරියේ අප හට විවිධාකාර ලෙස සාක්ෂි දැරීමට දෙවිඳුන් අප කැඳවා ඇත. උදා: පූජක, පැවිදි සහ ගිහි නායකත්වය තුළ ජේසුගේ ජීවමාන බව අත්දැකීමට තිබෙන උතුම්ම අවස්ථාව වන්නේ දිව්‍ය පූජාවයි. දිව්‍ය පූජාව තුළ අපි සැම එකට යැදීම උතුම් මොහොතක්ය. එම උතුම් මොහොත ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ මොහොතක්ද වෙයි. එය තුළ ගිහි පැවදි සහ පූජක යන කොටස් තුනම ස්වර්ගයේ මාර්ගය එළිය දකින මොහොතක්ද වෙයි.

අප ජීවිතයේ අවසාන කාලය එනම්, දෙවිඳුන් දුන් ජීවිතය තුළ දෙවිඳුන් ඉදිරියේ සාක්ෂි දරා මෙලොවින් සමුගෙන ස්වර්ගයේ ජීවිතය තුළ අප විශ්වාස කල ජීවමාන ජේසුගේ ශ්‍රී මුහුණ දැකීමේ උතුම් මොහොතය. ඒ උතුම් මොහොත ලබා ගැනීමට අප සැමට ජේසු ආරාධනා කරන්නේ පාරිශුද්ධ වූ ආත්මයක් අප ජීවිත තුළ ඇති කර ගන්නටයි. ඒ තුළ අප ලබන උතුම්ම තිලිණය වන්නේ ජේසුව දැක ගැනීමයි. එය අපගේ විශ්වාසයේ ගමනේ ජයග්‍රහණයි. පුංචි දුවේ පුතේ, දෙමාපියනි, අපට ලැබී ඇති ප්‍රසාද නිධාන තුළ අප ජීවිත ජීවත් කරන්නේ නම් දෙවිඳුන්ගේ සුරතින් මැවුනු අප ජීවිත අර්ථවත් වේ. එසේම ලොව මවා අවසන් දින දෙවිපියාණෝ මනුෂ්‍යා දෙස බලා ලොවේ සොඳුරු බව ඉතා මනරම් ලෙස දැක ගත් ලෙසම ස්වර්ග රාජ්‍යය තුළ අප ආත්ම කෙරෙහිද උන් වහන්සේ සතුටු වෙයි.

දුවේ පුතේ අපේ බාල කාලයේ සිට ලොව සරසන්නට, ජේසුට පිදෙන මලක් වන්නට අපට අපේ දෙමව්පියන්ගේ ද මාර්ගෝපදේශය අවශ්‍යමය. සත්වන දින දෙවියන් වහන්සේ ආශිර්වාද කොට එය ශුද්ධවූ දිනයක් කලේ අප සැමට සබත් දිනය ශුද්ධවූ ලෙස ජේසු සමඟ ගත කරන්නටයි. එදින අපි ජේසු සමඟ පමණක් ගත කරන්නට අධිෂ්ඨාන කර ගනිමු. ජේසු පිහිටයි..

**ගරු මනුර ශිරෝන් ප්‍රේමරත්න පියතුමා**
**කුරුණෑගල පදවි ධර්මදූත අධ්‍යක්ෂ**

## සුදුතුම් පියාණනී



ගඟක් වෙමින් නිති පෙරටම ගලන්නට
පහනක් වෙමින් ආලෝකය බෙදන්නට
කතරට දිය බිඳක් ලෙස දන නිවන්නට
මඟ පෙන්නුවේ නිති ඔබමය කිතුඅපට

දෙවිඳුට යොමන්නට අප සිත් ඉවත නොදා
ගත්තා නොයෙක් යහ පියවර නොපිරී හෙලා
මුකුලිත වී තිබුණ අපි දිවි නිති පුබුද
සුදුතුම් පියෙනි ඔබට'ප ණයගැතිය සඳ

තවකල් දෙවිඳු හට සේවය කරන්නට
පවිටු දනන් දෙවිඳුන් වෙත යොමන්නට
තවකල් පිහිට වන්නට අසරණ දනට
පතනෙමි පියෙනි ඔබ හට දෙවිඳුගෙ පිහිට

**හිරුණි රංසිකා**
11 ශ්‍රේණිය
**ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බොටුගොඩ**

## සුදු පියා

දුටු සැවොම නෙත් පිනවා හද කළඹා සතුට ගෙනා
ආදර පියා පෙම් බරිනා ජන අමතා ගුණ බෙදනා
කවුරු වෙනා මෙලෙස දනා වෙත ඇදෙනා මෙත් සිතිනා
සුදු උතුමා පියා සෙනෙනා ලොව පතුරා ගුණ කරුණා

වැඩිය දිනේ ලක් දෙරණේ ජය ඝෝෂා පැතිර වුනේ
දස් ගණනින් ලක් වැසියන් සතර දිගින් රොක් වෙමිනේ
සතුට බෙදන් තුරුලු කරන් ආදරයෙන් එළමහනේ
ගරු බුහුමන් රඟකෙළියෙන් සසුන් පියන් තුටු කෙරුනේ

සමගි වන්න, මෙත් වඩන්න, සදාකල්හි ගුණ රකින්න
ජාති භේද නැති කරන්න, සැමටම කරුණා කරන්න
දෙව් දරුවකු විලස ඉන්න පිරිසිදු පෙම නිති වඩන්න
සුදුපිය මේ දෙය කියන්න, වැඩියේ අප රටට ඔන්න

**ෆ්‍රීඩා විල්ලවරායන්**

## සැරදේවා ශු. ජුසේවාස් මුනිතුමෙනි



**හරත දේශයේ ගෝවා**
**පුරයෙන් සමිඳු**
**මිදි උයනට බිහිවු**
**සැන්කෝලේ ගමේ**
**ශුද්ධවත් දරුවා වූ**
**ජුසේවාස් පියතුමෙනි.....**
**එදු රුදුරු ඕලන්ද පීඩන**
**සමයේ පූජකයෙකුගේ**
**පහස නොලත් අප**
**දේශයට යාචක වෙස්**
**ගෙන වැඩම කළ ඔබ**
**හෙළ දෙරණට ත්‍යාග වූ**
**උත්තරීතර තිළිණයකි.**
**හෙළදිව කිතුනුවෝ**
**එඬේරෙකු නොමැතිව**
**මංමුලාවු අසරණ බැටළුවන් සේ විසූ යුගයක...**
**මේ දෙරණ තුළ විශ්වාසයේ බීජ වපුරා**
**දෙව් වදනින් පෝෂණය කළේ ඔබයි.......**

**අනුරාධා නිමාෂි**
ලොයොලා විදුහල - බෝපිටිය

## ළමුන් වෙනුවෙන්ම රචනා වූ ග්‍රන්ථයක්




ළමුන් වෙනුවෙන් රචිත ''විස්සයි විස්ස'' ග්‍රන්ථය මෑත භාගයේ මා හට කියවන්නට ලැබුණු ඉතා වටිනා ග්‍රන්ථයකි. මෙම ග්‍රන්ථයේ කර්තෘ වනුයේ කුරුණෑගල පදවියේ සිරිල් පෙරේරා මහතාය. අපේ ළමා ප්‍රදීපය ලේඛකයින් හා පාඨකයින්ට මෙම නම නම් හොඳට හුරු පුරුදුයි. මෙතුමන් ළමා ප්‍රදීපයට මුද්දර පිළිබඳව ලිපි පෙළක් ඉදිරිපත් කල අතර ඉතා වටිනා කියනා ඔවදන් ළමුන්ට ලබා දෙමින් ලියු හරවත් ලිපිද පලවී ඇත.

''වචනයකින් කළ වෙනසක්'' ''ඝනදුරේ දුන් පාඩම'' ''සැබෑ කතෝලික සාක්ෂි දැරීම යනු කුමක්ද?'' ආදි තේමාවන් 20 ක් යටතේ ආදර්ශමත් කතා විස්සක් ඇතුළත් මෙම ග්‍රන්ථයේ මිල රු 50 කි. මෙ ග්‍රන්ථය ළමෙකුට ත්‍යාගයක් ලබා දීමටද කදිමයි. ළමුන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ළමුන්ගේ හදවතට කතා කරමින්, ළමා මනසට දැනෙන ලෙසින් තම ''විස්සයි වස්ස'' පොත් පිංච රචනා කළ සිරිල් ඩී. පෙරේරා මහතාට ළමා ප්‍රදීපය සුබ පැතුම් ! **කුමර නයනජිත්**

# අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව - 2015

## කතෝලික ධර්මය විෂය නිර්දේශය ඉතාම සරලව හඳුනා ගනිමු.

- ★ මුලින්ම, 10/11 ශ්‍රේණිවල සිසු දරු දැරියන්ට කතෝලික ධර්මය පොත් දෙකක් හඳුන්වාදී ඇති අතර, එයට පදනම් වූ ග්‍රන්ථය වන්නේ , කතෝලික සභා ධර්මෝපදේශයයි.

- ★ කතෝලික සභා ධර්මෝපදේශය යනු දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව බිහිවූ විශ්වසයීය ධර්මෝපදේශ ග්‍රන්ථයයි.

- ★ එය ප්‍රධාන කොටස් හතරකි. එම ග්‍රන්ථයේ ප්‍රධාන කොටස් හතර, (iv) 10/11 ශ්‍රේණිවල ප්‍රධාන තේමා 04 ලෙස සැලකේ.

- ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරිත්වය
- දේව වරප්‍රසාද ලබා දෙන සක්‍රමේන්තු (දේව ප්‍රසාද නිධාන)
- දේව පනත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතයක්
- ක්‍රිස්තියානි යාච්ඤාව

- ★ 10 ශ්‍රේණිය සහ 11 ශ්‍රේණිය තේමාව දිව යන්නේ, කතෝලික සභා ධර්මෝපදේශ ග්‍රන්ථයෙහි පළමු කොටස සමගයි. එනම් , ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය යන්නයි.

- ★ වෙන් වෙන් වශයෙන් පෙළපොත් දෙකක් ලෙස 10 සහ 11 ශ්‍රේණි පෙළපොත් දෙක තිබුණද, අවසානයේ එම පොත් දෙක එක සංකලනයක් සේ පහත මාතෘකා විග්‍රහ කරයි.

- ★ දෙවියන් වහන්සේ සහ මැවිල්ල
- ★ ආදි පීතෘවරු
- ★ ගිවිසුම් සංකල්පය
- ★ දිව්‍යසිවර දූත මෙහෙවර
- ★ ඊශ්‍රායෙල් ජනතාවට විමුක්තිය දුන් මෝසෙස්
- ★ පුරාණ ගිවිසුම තුළ දේව අනාවරණය
- ★ නව ගිවිසුමේ දේව පුත්‍රභාවයේ අනාවරණය
- ★ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත මෙහෙවර
- ★ ජේසුස් වහන්සේව ජීවත් කළ මුල් කිතුනු සභාව
- ★ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය වැළඳගත් සුවිශේෂ චරිත
- ★ ශුද්ධ වූ සභාව තුළ අනාවරණය
- ★ ශ්‍රී ලාංකීය කිතුනු ඇදහිල්ල

**අපි මෙම පාඩම තුළ 01 තේමාවට පිවිසෙමු.**

- දෙවන ප්‍රශ්න පත්‍රයේ පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ප්‍රශ්න 10 කි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 කි. මුළු ලකුණු 20 කි එම ප්‍රශ්න රටාව පළමුව හඳුනාගනිමු.

01. මුල් කිතුනු සභාවෙ තිබුණු නමුත් , එහෙත් නූතන කිතුනු සභාවේ දක්නට නැති ලක්ෂණය ලියන්න.

02. දෙවියන් වහන්සේ පූර්ණ වශයෙන් අනාවරණය වන්නේ කා තුළින්ද?

03. මැවිල්ලට එරෙහිව ක්‍රියාකාරී වීමෙන් ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න.

04. ලන්දේසී පීඩන යුගයේදී මෙරට කතෝලික විශ්වාසය රැකදුන් ධර්මදූත නිකාය නම් කරන්න.

05. දේව රාජ්‍යයේ ලක්ෂණ දෙකක් නම් කරන්න.

06. මිනිසා කිසිම දිනක දෙවියන් වහන්සේ අසරණ නොකරන බව සනාථ කෙරෙන පැරණි ගිවිසුමේ කේන්ද්‍රගත සිද්ධිය නම් කරන්න. (2008/01/01)

07. ''ජීවිතය දෙවියන් වහන්සේගෙන් ඔබ ලබන තිළිණයකි''ශුද්ධ බයිබලයේ මෙම කථා පුවත සඳහන් ග්‍රන්ථය නම් කරන්න. 2008/01/11)

08. ලන්දේසී පීඩන සමයේදී බිඳ වැටුණු කතෝලික විශ්වාසය යළි ගොඩ නැගීමට දායක වූ මිෂනාරි පියතුමන්ලා දෙදෙනකු නම් කරන්න (2008/01/iv)

09. පොළොවෙහි දී පව් කමා කරන්න මනුෂ්‍ය පුත්‍රයාට බලය ඇති බව ඔබ දැනගන්නා පිණිස මම මෙය කරමි'' ඉහත ප්‍රකාශය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය කුමක්ද? (2008/01/v)

10. ජේසුස් වහන්සේ ඉගැන්වූ මෙම ඉගැන්වීම සම්පූර්ණ කරන්න. ''මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් ..................''

11. ආදි පීතෘ ආබ්‍රහම්ගේ ජීවිතයේ පිළිඹිබු වූ විශේෂිත ලක්ෂණ 4. කුමක්ද? (2009 /01/1)

12. දෙවියන් වහන්සේ මිනිසාට අනාවරණය වූ ආකාර දෙකක් ලියන්න 2009 /01/ 111

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# ලංකා අපෝස්තුළුවරයාණන් මිහිදන් කළේ කොතැනද?

**පසුගිය ලිපිය හා සබැඳේ**

ශුද්ධවූ ජුසේ වාස් මුනිතුමන් විසින් සාදන ලද්දාවූ ද, ක්‍රි.ව. 1711 ජනවාරි මස 19 වන දින එතුමන්ගේ ශ්‍රී දේහය, පූජක වස්ත්‍රයෙන් හා අගනා සේද රෙදි වලින් සරසන ලද මිනිපෙට්ටියක බහා අන්‍ය ලබ්ධිකයන් (මිසදිටුවන් සත්‍යාග මට හැරවීමේ) සත්‍යවිශ්වාසයට හැරවීමේ අප ස්වාමිදුගේ දෙව්මැඳුරේ දී ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වෙස් සහ අල්මේදා යන පියවරුන් විසින් මිහිදන් කරන ලද බව ඔරතෝරියානු වාර්තාවන්හි සඳහන් වේ.

කල්යත් ම ක්‍රි.ව. 1746 දී විජය රාජසිංහ රජවිසින් බෞද්ධයින් සතුටු කරනු වස් කිතුනු දෙව්මැඳුරු විනාශ කරන අවස්ථාවේ දී මේ දෙව්විමන විනාශ කරන ලදි. තවද ක්‍රි.ව. 1711 දී නරේන්ද්‍රසිංහ හෙවත් කුණ්ඩාලේ කුමරු භාග්‍යවත් ජුසේ වාස් පියතුමා ස්වර්ගස්ථ වූ කල නගරය තුළ වූ දේවස්ථානයේ එතුමන්ගේ ශ්‍රී දේහය මිහිදන් කරන්නට දෙන්නේ එකල පැවැති බෞද්ධ විරෝධතා මධ්‍යයේය. කිසිදු භික්ෂුන්වහන්සේ නමකට හෝ, රජකුට හෝ ප්‍රභූවරයකු හෝ නගර සීමාවේ ආදාහන හෝ භූමදාන කිරීමට අවසර නොලැබ තිබුනි.

එතුමාගේ මරණයෙන් සුළු කලක් ගතවූ ඉක්බිති එනම් ක්‍රි.ව. 1714 දී එතුමන්ගේ ශ්‍රී දේහය ගෝව පුරයට රැගෙන ගියේ" යැයි කටකතාවක් ප්‍රචලිත විය. මෙයින් කැළඹීමට පත් නරේන්ද්‍රසිංහ රජ තෙමේ තම නියෝජිත පිරිසක් දේවස්ථානය වෙත යවමින්. ඔවුන් ඉදිරියේ ජුසේ වාස් මුනිඳුන්ගේ සොහොන විවෘත කරන ලෙස ගොන්සාල්වෙස් පියතුමාට බලකළ බවත්, ගොන්සාල්වෙස් පියතුමා ද ඔවුන්ගේ බලපෑම මත සොහොන විවෘත කරන්නට අණ දී "දේහය සහිත මිනි පෙට්ටියේ පාද කොටස විවෘත කළ විට, ඉන් ඉවතට ගනු ලැබූ හොඳ තත්ත්වයෙන් පැවති සපත්තුවක් තුළ පාදයේ ඇටයක් වූ බැවින්, පෙර කී කතාව අසත්‍යයක් බව රජු ප්‍රකාශ කරන ලදි. මන්ද නරේන්ද්‍රසිංහ රජ තෙමේ ඉතා කුළුපග වූ ශු. ජුසේවාස් මුනිඳුන් ඇසුරට පත් කළ අයෙකි. එය එතුමන්ගේ මරණින් වුවද අඩුනොවීය. මෙකී දේවස්ථානය ක්‍රි.ව 1699 ප්‍රථම පීඩනයක් හේතුවෙන් විනාශ වුණි. මහනුවර සේවය කළ පියවරුන් අතර ජුසේ වාස් පියතුමා හැරුණු විට ගරු. ජෝශප් කර්වල්ගෝ පියතුමා ද, ගරු. පේද්‍රෝ සල්දානා පියතුමා ද, ගරු ඉග්නේෂියස් අල්මේදා පියතුමා ද, ගරු ජාකෝමේ ගොන්සල්වෙස් පියතුමා ද, ගරු ක්‍රිස්ටෝමෝ ෆර්ඩිනැන්ඩස් පියතුමා ද, ගරු දමියාඕ වැලේරියානෝ පියතුමා, යන පියවරු මෙහි " කැපී පෙනෙයි. ජුසේවාස් පියතුමා විසින් ඉදිකරන ලද්දා වූ ද, එතුමාගේ සිරුර මිහිදන් කළාවූ ද, දේවමාතාවන්ට කැපවූ දේවස්ථානය ගරු ඉග්නේෂියස් අල්මේදා පියතුමා විසින් අලුත්වැඩියා කරන ලදී.

ක්‍රි.ව. 1699 සැප්තැම්බර් මාසයේ සිට 1746 දක්වා වූ වසර 47 ක් පැවති මහනුවර දේවස්ථානයේ මිහිදන් කරන ලද පියවරුන්

1702 ජුලි 23 වන දින -
ගරු ජෝශප් කර්වල්හෝ පියතුමා
1711 ජනවාරි 19 වන දින -
ශු. ජුසේ වාස් මුනිතුමා
1731 දෙසැම්බර් 05 වන දින -
ගරු ක්‍රිස්ටෝමෝ ෆර්ඩිනැන්ඩර් පියතුමා
1727 ජුලි 30 වන දින -
ගරු දමියාඕ වැලේරියානෝ පියතුමා

මහනුවර දේවස්ථානයේ රැඳී සිටි අවසාන පියතුමන්ලා ලෙස හැඳින්වන්නේ ගරු මතියස් රොද්‍රිගස් හා ගරු සෙලෙස්තීනු පෙරෙයිරා යන පියවරුන් ය. ශු. ජුසේවාස් මුනිඳුන් විසින් ඉදිකරනු ලැබුවාවූද, උන්වහන්සේගේ ශ්‍රී දේහය මිහිදන් කළ දෙව්මැඳුර මිසදිටු පිරිසක් විසින් ක්‍රි.ව. 1745 දී විනාශ කරන ලදි. එහෙත් මේ දෙව්මැඳුර පිහිටි තැන ගැන කතාවක් පවා නොමැති හෙයින් ලංකා අපෝස්තුවරයා මිහිදන් කළ ස්ථානය නිශ්චිතව කොතැන දැයි අපි නොදනිමු.

අප එය දන්නේ "බෝගම්බර" නගර සීමාවේ එක්තරා කොටසක කියාය. නගරය පුරා දැන් පවතින එක් පසෙක වැව (බෝගම්බර) හා කඳු අතර පිහිටි මේ ප්‍රදේශයේ එක් පසෙක දුම්රිය පොළද, බෝග ම්බර බන්ධනාගාරයද, තවත් ගොඩනැගිලි හා කඩසාප්පු පෙළක්ද දක්නට ලැබේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස බෝගම්බර වැව පුළුල් කළෙන් පැරණි දෙව්මැඳුර ජලයට



යටවන්නට ඇතැයි ද? අනුමාන කළ හැකිය. ක්‍රි. ව. 1746 දී පීඩනය හදිසියේ හට ගත්

බැවින් මහනුවරින් පිටුවහල් කළ පියවරුන්ට ඔවුන් සමග මෘතදේහය ගෝවට ගෙන යාමට හෝ ඒ ගැන සිතීමටවත් කාලයක් නොවීය. ඔවුන් එලෙස ක්‍රියා කළානම් ගෝව පුරයේ ඒ ගැන කිසිදු සඳහනක් හෝ සිහිවටනයක් දක්නට නොලැබීම පුදුමයකි.

1963 දී මහනුවර නගරයේ ජල සැපයුම සඳහා ජලනල වැළලීමට පොළොව කණින අවස්ථාවේදී යටිනුවර විදියේ ගුණසේන පොත් හල ඉදිරියේ මතුපිට සිට අඩි 06 ක් පමණ ගැඹුරින් වළලා තිබූ සම්පූර්ණ ඇට සැකිල්ලක් හමුවිය. මේ හා සමග තවත් දිරාපත් ඇටසැකිලි කීපයක් හමුවූ අතර ඉහත ඇටසැකිල්ලේ විශේෂත්වය වූයේ එය අඟල් 2 ක් පමණ වූ සණ කොස් ලෑලි පෙට්ටියක බහා තිබීමයි. එසේ තිබූ තෙතමනය හා දියසීරාව මධ්‍යයේ පවා බහාලුම සුරක්ෂිතව තිබූ බවත්. එහි භාරකාරත්වය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වූ බැවින්, එකල සිටි පුරාවිද්‍යා කොමසාරිස් තුමාගේ නියෝග යෙන් ඇටසැකිල්ල උඩවත්තකැලය පාමුල මිහිදන් කළ බවත්, බහාලුම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ගත් බවත් සඳහන් වේ.

ඉදිරියට .......

**අසේල දසනායක**

# සුදුතුම් පිය ලංකා චාරිකා

**පසුගිය සතියෙන්.......**







එදින සන්ධ්‍යාවේ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති සර්වාගමික ආගමික හමුව අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ වෙසෙස් අවධානයට ලක් වූ හමුවකි. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව හයසියයකට අධික බුද්ධ පුත්‍රයාණන් වහන්සේගෙන් පිරී ඉතිරී ගොස් තිබිණ. බෞද්ධ භික්ෂූන් වහන්සේට අමතරව හින්දු කුරුක්කල් තුමන්ද ඉස්ලාම් පූජක තුමන්ද, කිතුනු රදගුරු හිමිපාණන්ද මේ අවස්ථාවට එක්ව සිටි අතර දහසකට අධික පිරිසකගේ සහභාගිත්වය ගැන සසුන් පියා මහත් ආනන්දයෙන් සිහිපත් කරන බැව් ගරු ලොම්බාඩි පියතුමා පැවසීය එදා සසුන් පියාණන්ට මෙරටට වැඩම කරන්නැයි අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ආරාධනා කළ මොහොතේදී ශ්‍රී ලංකාවේ සිවු මහා ආගම්වල අති පූජනීය භාවයත්, එකී ආගමික කොටස් සාමයික සමගියෙන් එක්ව දිවි ගෙවන ආකාරයත් අත්දකින්නට මෙරටට වැඩම කරන්නැයිද පැවසූ දේවල් ප්‍රයෝගිකව පෙන්නුම් කළ අවස්ථාවක් ලෙස මේ සර්වාගමික හමුව දැක්විය හැකිය. ආසියාකරයේ විවිධ ආගමික කොටස්වල සබැඳියාව පිළිබඳ අත්දැකීම් රැසක් ගොනුකර ගන්නට සමත්වූ ශුද්ධෝත්තම පියතුමා සර්වාගමික ආගමික සමගිය සඳහා ශ්‍රී ලංකාව අපූරු නිදසුනක් ලෙස හෙට දිනයේ යොදා ගතහොත් එය පුදුම වීමට හේතුවක් නොවේ.

2015 ජනවාරි 14 වැනිදාට යෙදී තිබු භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසවීමේ ඓතිහාසික මොහොතට එක්වන්නට දිවයිනේ අට කොන් දිසාවන්ගෙන් සැදැහැවතුන් ගාලු මුවදොර පිටියට ඇදී ආවේ ජනවාරි 13 වැනිදා පටන්ය. අතීතයේ වන්දනා ගමන් විසිඑක්වන සියවසේ නැවත වරක් සාක්ෂාත් කරමින් මී වදයක් සොයා ඇදෙන මී මැසි සේනා මෙන් ජනතාව මුළු රැය පුරා ගාලු මුවදොර පිටියට ඇදුනාහ. රාත්‍රියේ ජනවන්දනා පිළිවෙත් මගින්ද විවිධ ආගමික වැඩසටහන් මගින්ද ජනතාව ආධ්‍යාත්මික පෝෂණය කරන්නට පියවර රැසක් ගෙන තිබුණි. ජනවාරි 14 වැනිදා පෙරවරු කාලය වන්තම ගාලුමුවදොර පිටිය අතුරු සිදුරු නැතිව පිරීගොස් තිබුණි. පෙරවරු 7.40 වන විට ගාලුපාර ඔස්සේ අශ්වාරෝහක බල ඇණියක් පෙරටු කරගෙන අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා ගාලු මුවදොර පිටිය කරා කැඳවාගෙන ගිය අතර ඉන්පසු විවෘත රියක නැගී සසුන් පියා ගාලුමුවදොර රොද බැඳ සිටි ජනතාව අතරට ගියේය.

# වේ රසබර මතකසටහන්

## කිතුනු උරුමය







වසර තුන්සියයකට අධික කාලයක් පුරා මෙරට කිතුනු ජන හද සන්තානයේ පැතුම් සපුරාලමින් භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසවීමේ ඒ ඓතිහාසික මොහොත දැක බලා ගත්තේ මෙරට සැදැහැවතුන් පමණක් නොවේ. ඉන්දියාවේ ගෝව ප්‍රමුඛ ප්‍රදේශ ගණනාවකින් පැමිණි දහස් සංඛ්‍යාත බැතිමතුන්ද පූජක, රදගුරු හිමිපාණන්ද සීෂෙල්ස් ඇතුලු විවිධ රටවලින් පැමිණි ජනකොටස්ද ලක්ෂ පහකට අධික මේ මහා ජන සන්නිපාතය අතර සිටියහ. මහනුවර රදගුරු ජාතික ජුසේවාස් කාර්යාංශයේ සභාපති අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් විසින් සාන්තුවරයට එසවීමේ අයැදුම ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිවෙත් පුරන්නට සසුන් පියා පියවර ගත්තේය. මීට විසි වසරකට පෙර ගාලුමුව දොර පිටියේදී ම අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියා වන්දනීය ජුසේ වාස් තුමන් භාග්‍යවරයට එසවූ ඒ ඓතිහාසික මොහොත යළි කුළු ගන්වමින් අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණෝ භාග්‍යවන්ත ජුසේවාස් තුමන්ව සාන්තුවරයට එසවූහ. ඉන්පසු දිව්‍ය පූජා පිළිවෙත පැවැති අතර ජනතාව දැඩි භක්තියකින් ඊට හවුල් වන අයුරු දැක ගන්නට ලැබිණි.

එය නිමවීමෙන් අනතුරුව සවස අවධානය යොමුව තිබුණේ මරුද මඩු සිද්ධස්ථානය කරාය. ශුද්ධොත්තම පියතුමා වතිකාන ශුද්ධාසන නියෝජිතයන්, මෙරට අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ රදගුරු හිමිපාණන් මරුද මඩු සිද්ධස්ථානයේ මේ ඓතිහාසික අවස්ථාව සඳහා ගුවන් මගින් එහි ගිය අතර ලක්ෂ සංඛ්‍යාත පිරිසක් එහි එක්රොක්වී සිටියහ. මඩු මාතාවන්ගේ සෙවනේ රටට සාමය, සංහිඳියාව පතා උතුරත් දකුණත් එක්වන්නට කළ අයැදුම සැදැහැ නෙතට කඳුළක් ගෙන එන්නට සමත් විය. ඉතිහාසයේ මුල්වරට සිරිලකට සැපත්වූ සසුනිසුරාණන් නමක උතුරට යෑම මෙවර සනිටුහන් වූ අතර එය සුවිශේෂි මංසලකුණක් ලෙසද දැක්විය හැකිය.

ඉදිරියට .......

✍ ශිරාන් මෛත්‍රි

# ශුද්ධවූ පවුලේ දරුවන් වෙමු අපි සැම



සැම කුඩා ඔබ වැන්නවුන් සමඟ ''ජේසු'' ඉන්නවා ඔබ දන්නවාද? විශේෂයෙන් පසුගිය දින පැවති ශුද්ධවූ පවුලේ දිනය ද දෙමාපියන් සමඟ එකම ස්ථානයේ සිට ඔබ වැනි කුඩා දරු දැරියන් දිව්‍ය පූජාව අසද්දී. දිව්‍ය පූජාවෙන් පසු දෙමව්පියන් වැද සිපගත් හැටි සිහිවන විට නිතැගින්ම දෑසට කඳුළු බිඳු කීපයක් එකතු වීම දෙමාපියන් වශයෙන් අප අත් දැකපු දෙයක්. ශුද්ධවූ පවුලේ මංගල්‍යය දිනදී දෙමාපියන් වශයෙන් අපි දරුවන් සමඟ එකතුව සැම කටයුත්තක්කර අවසන් වන්නේ නැහැ. මතු අනාගතයේදී ඔබේ සුරක්ෂිතභාවය උසස් අධ්‍යාපනය , විනය ඇතුව දයද කිරීම අපට ආවේනික දෙයක් එයට වඩා විශාල මෙහෙවරක් දෙමාපියන් වන අපට කරන්න තිබෙනවා. ඒ ආධ්‍යාත්මික වශයෙන් ඔබව පෝෂණය කොට ජේසුගේ ආධ්‍යාත්මික ගුණය දයාව , ප්‍රේමය, සෙනෙහෙවන්ත භාවය, අනුකම්පාව, ආදරය සමාව බෙදදීම ආදි කැරුණුයි.

දෙමාපියන් සමඟ මිතුරන් , මිතුරියන් මෙන් ඇසුර කිරීමෙන් බොහෝ දුරට ඔබටත් ඔවුන්ටත් ඇති ගැටලු, විසඳුම් වලට සහනය ලැබෙනවා මෙන්ම ජේසුස් වහන්සේ මරිය මව් තුමිය හා ජුසේ තුමන් වෙත තිබු ආදර්ශමත් පවුලක් ලෙස සමාජ ගත වීම සුවිශේෂී වෙනවා. එය සමාජ ගත කිරීමේදී ඉහත කී ඔවදන් තුළ ජීවත්වීම සමාජයේ වෙනත් මඟකට ගමන් කරන පවුල් වෙතොත් ඔබේ පවුලේ ගති පැවතුම් දෙස බලා සුමඟට යොමු වීම තුළ ඔබටද දෙව් පියාණන්ගේ ආශිර්වාදයේ කොටස් කරුවෙකු හෝ කාරියක වෙන බව මට විශ්වාශයි. ශුද්ධවූ පවුලක අසිරිය ඔබටද හිමි වේවා!

**ගෙලිඔය ජුඩ්.ජේ ප්‍රනාන්දු මාමා විසිනි.**

## ළ.ක්‍රි.වී ළමුන්ගේ සෞන්දර්ය උළෙල

ළ.ක්‍රි.වී. ව්‍යාපාරයේ 2014 - 2015 සෞන්දර්ය වර්ෂය නිමිත්තෙන් පවත්වනු ලැබූ කුසලතා ඇගයීම් මාලාවන් හි ජාතික මට්ටමින් ජයග්‍රහණය ලැබූ දුවා දරුවන්ගේ ත්‍යාග ප්‍රධානෝත්සවය හා ඔවුන්ගේ කුසලතාවයන් එළි දැක්වීම වෙනුවෙන් පැවැත්වෙන සෞන්දර්ය උළෙල 2015 පෙබරවාරි 07 වන දින පෙ.ව 9.00 ට මීගමුව ලොයෙලා විදුහල් ශ්‍රවණා ගාරයේදී පැවැත්වේ. **කුමර**

## ළමා ලේඛක වැඩමුළු

### කොළඹ පදවිය

පෙරියමුල්ල තුෂාරයේ අප ස්වාමිදුගේ දෙව්මැදුරේ දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2015 පෙබරවාරි 08 වන ඉරුදින එම දෙව්මැඳුරේදී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු රංජිත් ටෙරි පියතුමාගේ අදහසකට අනුව දහම් පාසලේ ආචාර්ය මණ්ඩුල්ලේ සහයෝගයෙන් මෙය සංවිධානය කරයි.

## දෙව්මැදුරේ ජයන්තියට දහම් ළමුන්ට රචනා තරඟයක්



දළුගම සාන්ත ප්‍රැන්සිස් සාලෙස් දෙව්මැදුරේ සැමරූ 150 වන ජයන්ති මහෝත්සවය වෙනුවෙන් දළුගම දහම් පාසලේ සිසු සිසුවියන් සඳහා දෙව්මැදුර කැප කොට ඇති සාන්තුවරයා පිළිබඳ රචනා තරඟයක් සංවිධානය කෙරෙනි. මේ සඳහා සහභාගි වූ සිසු සිසුවියන්ගෙන් කොටසක් සේයාරුවෙහි දැක්වේ. **දිනේෂ් පෙරේරා**

මාසික සිතිවිල්ල

**මාසික සිතිවිල්ල - ජනවාරි මාසය ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු පදවි (1886-2015)

**1 කොළඹ අගරදගුරු පදවිය** (1886.09.01)

රටකට අගරදගුරු පදවි කිහිපයක් තිබිය හැකි ය. එහෙත් ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් නිසා එයට ඇත්තේ එක් අගරදගුරු පදවියක් පමණි. ඒ කොළඹ අගරදගුරු පදවියයි. ශ්‍රී ලංකාවේ ඇති සෙසු රදගුරු පදවි කොළඹ අගරදගුරු පදවියේ පරිවාර රදගුරු පදවි වේ. 1886 දී කොළඹ අගරදගුරු පදවියට තිබුණේ යාපනය හා මහනුවර යන පරිවාර රදගුරු පදවි දෙක පමණි. එහෙත් ක්‍රි.ව. 2014 අගෝස්තු මස 31වන දින වන විට කොළඹ අගරදගුරු පදවියට පරිවාර රදගුරු පදවි 11ක් තිබේ. එම එක් එක් පරිවාර රදගුරු පදවි හා ඒවා එක් වූ වර්ෂයන් මෙසේ ය: යාපනය (1886), මහනුවර (1886), ගාල්ල (1893), ත්‍රිකුණාමලය (1893), හලාවත (1939), බදුල්ල (1972), මන්නාරම (1981), අනුරාධපුරය (1982), කුරුණෑගල (1987), රත්නපුරය (1995) හා මඩකලපුව (2012).

1944 දෙසැම්බර් මස 06වන දින, කොළඹ අගරදගුරු පදවියේ නාමය, "ලංකාවේ කොළඹ අගරදගුරු පදවිය" යනුවෙන්, අති උතුම් දොළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමා (1939-1958) විසින් වෙනස් කරනු ලැබුව ද, නැවතත් 1972 මැයි මස 22වන දින, අති උතුම් හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමන් (1963-1978) විසින්, "කොළඹ අගරදගුරු පදවිය" යන සරල නාමය, එයට ප්‍රදානය කරන ලදි. කොළඹ අගරදගුරු පදවියට කොළඹ, ගම්පහ හා කළුතර යන පරිපාලන දිස්ත්‍රික්ක තුන ඇතුළත් මුළු බස්නාහිර පළාත ම අයත් වේ. ශ්‍රී ලංකාවේ කතෝලික ජනගහනයෙන් 50%ක් පමණ කොළඹ අගරදගුරු පදවිය (බස්නාහිර පළාත) තුළ ජීවත් වෙති.



සාන්ත ලුසියා මුනිතුමිය, කොටහේන ආසන දෙව්මැදුරේ නාම සාන්තුවරිය ලෙස ද, සාන්ත ලෝරන්ස් මුනිතුමා, කොළඹ නගරයේ නාම සාන්තුවරයා ලෙස ද, ස්වර්ගාරෝපිත නිර්දෝෂ දේවමාතාවන්, කොළඹ අගරදගුරු පදවියේ නාම සාන්තුවරිය ලෙස ද, ප්‍රකාශයට පත් කොට ඇත.



**ප්‍රථම අගරදගුරු හිමි** :

අති උතුම් ක්‍රිස්ටෝපර් බොන්ජන් (නි.ම.නි.) හිමිපාණෝ

**සෙසු අගරදගුරු හිමිපාණෝ:**

අති උතුම් ඇන්ඩෘ මැලිසන් (නි.ම.නි.) හිමිපාණෝ
අති උතුම් ඇන්තනි කුඩේර්ට් (නි.ම.නි.) හිමිපාණෝ
අති උතුම් පීටර් මාර්ක් (නි.ම.නි.) හිමිපාණෝ
අති උතුම් ජෝන් මේරි මසොන් (නි.ම.නි.) හිමිපාණෝ
අති උතුම් තෝමස් කාදිනල් කුරේ (නි.ම.නි.) හිමිපාණෝ

**විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ:**

අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණෝ
අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ

**වත්මන් අගරදගුරු හිමි:**

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ

**අගරදගුරු පදවියේ වත්මන් සහායක රදගුරු හිමිපාණෝ :**

අති උතුම් මේරියස් පීරිස් හිමිපාණෝ
අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ
අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ

**ආසන දෙව්මැදුර :** කොටහේන සාන්ත ලුසියා ආසන දෙව්මැදුර

**ජාතික බැසිලිකාව :**

තේවත්තේ ශ්‍රී ලංකා අප ස්වාමිදූගේ බැසිලිකාව

**ඉදිරියට.........**



## අපේ සුදුතුම් පියා

**හිරුෂ නානායක්කාර**

07 ශ්‍රේණිය

ගොන්සල්වෙස් විදුහල - පමුණුගම

## දිව බොදුනින් සව්මත් වෙමු

**ප්‍රමුද් ඉමල්ෂණ**

07 ශ්‍රේණිය

ශු. බෲනෝ මුනිඳු දහම් පාසල - තඹකන්ද





## ශු. ජුසේවාස් මුනිතුමා

**අවේන් දිනුෂි**

11 ශ්‍රේණිය

සා. මරියා දහම් පාසල - සීදූව




## හිරු උදාවේ සුන්දරත්වය

**කවීශර සිතුමිණ**

02 ශ්‍රේණිය

සා. ජෝසප් විදුහල - මරදාන



පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## දෙව්පියා මැවූ ලස්සන ලෝකය

**සෙනිතු ජයකොඩි**

02 ශ්‍රේණිය

ශා. පීතර විදුහල - උඩුගම්පොළ



## මුහුදු වෙරළක්

**ශාමිකා මධුෂාන්**

06 ශ්‍රේණිය

පිරිසිදු දේව මාතා ධර්මදූත ළමා සමාජය - කඳන



# සා. මැටිල්ඩා මුනිවරිය

| | | |
|---|---|---|
| අරක්ගත් මුනිවරය | : | දරුවන්, බලාපොරොත්තු රහිතකරන විට |
| ජීවිත කාලය | : | 895-968 |
| මංගල්‍යය දිනය | : | මාර්තු 14 |
| රට හෝ ග්‍රාමය | : | ඩෙන්මාර්කය |






යුරෝපයේ රූප වන්දනාව ක්‍රියාත්මක වන වකවානුවක කිතුනු ජීවිත ක්‍රමය සඳහා එතරම් මග පෑදීමක් නොවීය. මෙවැනි වකවානුවක වර්ෂ 895 දී වෙස්ට්පාලියා හි ආදිපාදවරයා වන ඩිඑට්‍රිච්ට දාව මැටිල්ඩා උපත ලැබීය. මව ඩෙන්මාර්කයේ ප්‍රභූ පවුලකින් පැවත ආ රේන්හිල්ඩ් විය. ආරාමික ශ්‍රේෂ්ඨ මව්තුමිය යටතේ ඇය හොඳ අධ්‍යාපනයක් ලැබීය.

තම තාරුණ්‍යයේ ප්‍රශ්න වලදී ඇය ශ්‍රේෂ්ඨ මව්තුමියගේ උපදෙස් ලබාගත්තාය. සැක්ෂන් රාජ්‍යයට උරුමකම් කියන හෙන්රි හා මැටිල්ඩා වර්ෂ 909 දී විවාහ විය. වසර තුනකට පසු තම මාමන්ඩියා මියයාම නිසා හෙන්රි , ආදිපාදවරයා විය. අවු . 7කට පසුව ප්‍රභූවරු හා රදගුරුවරු ඔහුව රජු ලෙස තෝරා පත් කරනු ලැබීය. එය යුද්ධ වැලක් පැවති කාල පරිච්ඡේදයක් විය. මැටිල්ඩා දයාවේ ක්‍රියාවල මෙන්ම දෙව්මැදුරු, ආරාම ගොඩ නැගීමේද නිතර විය. ඔවුනට දරුවන් 5 දෙනෙකු විය. ඒ අතර වූ ඔත්තෝ එම්පරදෝරු රජු විය. වර්ෂ 936 දී හෙන්රි රෝගාතුරව වී මියගියේය. දිනක් ඔහු වෙනුවෙන් පූජාව සිදුකළ පසු මැටිල්ඩා තම ආභරණ ගලවා පියතුමාට දී තම උතුම්වූ යාච්ඤාවේ හා දයාවේ ක්‍රියා සඳහා යොමුවිය. ස්වාමිපුරුෂයාගේ මරණින් පසු මැටිල්ඩාට ප්‍රශ්ණ රාශියකට මුහුණපාන්නට සිදුවිය.

රදගුරුවරු හා ප්‍රභූන් නව රජකු පත්කර ගන්නට සිටින විට ඔත්තෝ පළමු දරුවා වුවත්, හෙන්රි නියම ලෙස උපන් කෙනා බව පෙන්වා දුන්හ. එහෙත් පසුව ඔත්තොව තෝරාගන්නා ලදී. පසුව දරුවන් දෙදෙනා තම ප්‍රශ්න ගැටලු පසෙකලා මවට විරුද්ධව කටයුතු කරන්නට පටන් ගත් නිසා තම ධනය හා අනෙකුත් දෑ වෙනත් අයට බෙදා දීම නිසා දරුවන්ගේ දැඩි පීඩනයට පත්වූ ඇය වෙස්ට්පාලියා හි තම ගෙදරට කැඳවාගෙන ආහ. ඔත්තෝ ද සමාව ඉල්ලීය. එහෙත් නැවතත් ඇය දයාවේ ක්‍රියා වල නියැලීම නිසා ඔත්තෝ නැවතත් කෝපයට පත්වීය.

මැටිල්ඩා තම පුතු , සොහොයුරු හෙන්රිවත් පාලකයකු ලෙස පත් කරන ලෙස ඔත්තෝට කීය. එනම් බැවේරියාවේ ආදිපාදවරයා ලෙස පත්කරන ලෙසය. එහෙත් දරුවන් අතර තවත් ප්‍රශ්ණ උග්‍ර විය. ඇය ඒවා විසඳීමට මැදිහත් විය. කල් යත් යත් ඔත්තෝ තම මව සමග සුහද වී වර්ෂ 962 දී රෝමයට පැමිණ 12 වන ජුවාම් සු තුම් පියතුමන් විසින් හෝලි රෝමන් එම්පර ලෙස ඔටුනු පළඳනු ලැබීය. මැටිල්ඩා තුමිය දූප්පත්කම තුළ , බිම දිගාවී , අළු මත , තම තාපසිකාවන් මැද මිය ගියාය.

**අසේල දසනායක**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
80
කතාව. දෙබස්. චිත්‍ර
මෝසෙස් ඊශ්‍රායෙල් ජාතිකයින් ගලවා ගැනීමට බොහෝ වෙහෙස මහන්සි වී සටන් කරමින් ආ දිගු ගමනක අවසාන අවස්ථාවට ළඟාවී තිබුණි.
...එම අවස්ථාවේදී දෙවියන්... ...වහන්සේ මෝසෙස්ට කතා කර..
මෝසෙස්
මෝසෙස් තුමාට මෙම කාලසීමාව බොහෝ වැඩ බහුල කාලයක් විය.. එ දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජාතිකයින් වහල් භාවයෙන් ගලවා ගත් මොහොතේ සිට ... සිදුවීම් සටහන් කර තැබීය
ජෝෂුවාට ද වැඩ කටයුතු පුහුණු වීමේ වැඩ බහුල කාලයක් විය

# ප්‍රහේළිකා අංක 49




## හරහට

1. ''මා නුඹ කුසෙහි පිලිසිඳගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. යනුවෙන් මෙම දිවැසිවරයාව කැඳවීමේදී දෙවියන් වහන්සේ ඔහුට වදාල සේක.

4. පෞද්ගලික ඕනෑකම් ගැන කරදර නොවෙන්නැයි ප්‍රකාශ කරමි. තමුන්ගේ සකල තේජසින් සැරසී සිටි සලමොන් රජු වුවද මානෙල් ............ සේ විරාජමාන නොවී යැයි ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. සමාන................... ආශ්‍රය කළ යුතු බව පවසමින් ''මැටි මුට්ටිය යකඩ බුජම ළඟ තබන්නේ කුමට ද'' බුජම ඒ මත වැටුණු විට මැටි මුට්ටිය බිඳී යන්නේය. යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ සමාරීය ස්ත්‍රීයගෙන් බීමට මේවා ඉල්ලූ සේක.

7. ඔබගේ අසල්වැසියාට ඔහුගේ අවශ්‍යතාවයේදී මෙය ලබාදීම දයාවේ ක්‍රියාවක් බව උපදේශකයා හෙවත් සිරා පවසයි.

8. ''විපත්ති දවස් පැමිණෙන්නට පෙර, ඔබේ යොවුන් වියේදී ඔබේ මැවුම්කාර දෙවියන් වහන්සේ සිහිකරන්න'' යනුවෙන් පවසමින් ධර්මදේශකයා මොවුන් හට අවවාද කරයි.

## පහළට

1. ජොෂුවා සහ ඊශ්‍රායෙල් ජනතාව මෙහි පවුර වටා දින සතක් ගමන් කළ පසු මෙහි පවුර ඇද වැටුනේය.

2. අප බලාපොරොත්තු නොවන පැයකදී මනුෂ්‍යය පුත්‍රයාණෝ වඩින බැවින් තම ස්වාමියා සරණ මංගල්‍යයෙන් පසු කුමන ................ ට නිවසට පැමිණෙදැයි නොදන් නිසා අවදිව සිටින දාසයන් හා සමාන වැන්නැයි ක්‍රිස්තු වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචන.

3. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ වර මොවුන් සුව කළ සේක.

5. ඔබට ඊර්ෂ්‍යා කරන අයගෙන් ඔබේ .............. සඟවා ගැන්නැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ජෙරමියා 1/5 ශු. ලුක් 12/35, 27/ ජොසුවා 6, උපදේශකය හෙවත් සිරාක් 13/2, 29/2, 37/10, ධර්මඋපදේශකයා 11

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

**ප්‍රහේළිකා අංක 49 පිළිතුරු හා ප්‍රහේළිකා අංක 50 ලබන සතියේ**



උස්වැටකෙයිකාව ශා. මරියා විදුහලේ කණිෂ්ඨ අංශයේ 2015 පළමු වසරට දරුවන් ඇතුළත් වීමේ ආගමික කටයුතු උස්වැටකෙයියාව සා. මරියා දෙව්මැදුරේ පැවැත්විණි. තුඩැල්ල සහන මැදුරේ ගරු ක්‍රිසාන්ත ජයලත් පියතුමන් විසින් එම දරුවන් ආසිරි ගැන්වූ අයුරු ඡායාරූපයෙන් දිස්වේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**



මීගමුව සා. මරියා මහ විද්‍යාලයට පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේ උත්සවය එම විද්‍යාලයේදී පසුගියදා සිදු කෙරුණි. විදුහල්පති ගරු ජයන්ත වික්‍රම සිංහ පියතුමන්ද මේ අවස්ථාවට එක්වුණි. දරුවන් තම පන්තිකරා ගමන් ගත් අයුරු.

**රේමන් අපෝන්සු**

# ශ්‍රී ලාංකීය ජාතික කොඩිය ගැන

රටක ජාතික කොඩිය එම රටේ අනන්‍යතාව ලොවට පෙන්වන ප්‍රධාන සංකේතයයි. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය,පැරණි රාජකීය කොඩිය ඇසුරෙන් නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකා ජාතික කොඩිය අවසන් වරට වෙනස්කමකට භාජනය කලේ 1972 මැයි 22 දිනයි. එය සෘජුකෝනාස්‍රයකි. එහි දිග පළලෙහි අනුපාතය 1.2 වේ. එනම් උස/පළල ඒකක 1ක් වන විට දිග ඒකක 2ක් වන පරිදි ය. අප ජාතික කොඩියේ ඇති සිංහ රූපයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව පෙනෙන්නේ මීට වසර 500කට පෙර ලියවුනා යැයි සැලකෙන රාමායනයේ එකල ලංකාපුර නිවෙස්වල ධජ පතාක ළෙල දුන් බව සඳහන් වීමෙනි. එලෙසම ක්‍රි.පූ. 3 වන සියවසේ ඉන්දියාවේ සිටි අශෝක රජුගේ කාලයේ සාංචියේ ඇති විජයාවතරණය ලෙස සලකන ගල් කැටයමක දැක්වෙන එහි සේනාවේ ඇතකු පිට සිටින අයකු අත සිංහරූපය සහිත කොඩියක් දක්නට ලැබේ. මුල්ම වරට සිංහයා සහිත කොඩියක් දැක්වෙන්නේ එහි බව සඳහන් වේ. චුලවංශයේ සහ මහවංශයේ සඳහන් වන්නේ විජය කුමරු තම්මැන්නාවට සම්ප්‍රාප්ත වූයේ ද සිංහ රුව සහිත ධජයක් රැගෙන බවයි. තම ගෝත්‍රික නාමය වූ සිංහයා එයින් සමහර විට සංකේතවත් කරන්නට වෙන්නට හැක.

ක්‍රි.පූ. 2 වන සියවසේ දී වූ එළාර දුටුගැමුණු යුද්ධය දැක්වෙන දඹුළු විහාරයේ බිතු සිතුවමක දුටුගැමුණු රජුගේ සේනාවේ එක් අයෙකු අත සිංහ කොඩියක් තිබෙනු දැකිය හැකිය. සිංහයකු දකුණතින් කඩුවක් දරා සිටින අයුරු එහි වෙයි. ඊට ඉහළින් ඉර හා අඩ සඳ ද සිතුවම් කර තිබේ. ක්‍රි.ව. 1415 දී 6 වන පැරකුම් රජුගේ අභිෂේක උත්සවයේ දී ජයවර්ධනපුර කෝට්ටේ ඔසවන ලද්දේත් සිංහයෙකුගේ රූපය සහිත කොඩියක් ය. ක්‍රි.ව. 1657 ලන්දේසි විසින් පවත්වන ලද 2 වන රාජසිංහ රජතුමා සිහිපත් කිරීමේ උත්සවයේ දී ඔසවන ලද්දේද සිංහ කොඩියකි.

අතීත සිංහල රජවරු මෙලෙස සිංහයා තම රාජකීය කොඩිය සඳහා නොකඩවා යොදාගත් අතරම සිංහල රාජවංශයෙහි අවසානය වූ කන්ද උඩරට රාජධානියේ රජවරුද ජාතියේ සංකේතයක් වශයෙන් මෙම සිංහ කොඩිය භාවිත කළ බව පෙනේ. ඒ වර්තමානයේ ජාතික කොඩියට පෙර අපේ ජාතික කොඩිය ලෙස භාවිත වූයේ කන්ද උඩරට රාජධානියේ අන්තිම රජුගේ රාජකීය ධජයයි. 1815 පෙබරවාරි 25 වන දින වන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට අයත් වු සිංහාසනය, පාදස්ථලය, රාජමුද්‍රාව හා කොඩිය ද ඉංග්‍රීසීන් අතට පත් විය. එදා 1815 දී වාරියපොළ ශ්‍රී සුමංගල හිමිපාණන් ඉංග්‍රීසි කොඩිය බිම දමා නංවන ලද්දේ මේ සිංහ කොඩියයි. එහි ද දකුණතින් කඩුවක් ගත් සිංහ රුව සහිත වු අතර සිංහයා රන්වන් පාටින් යුක්ත වන අතර පසුබිම රක්ත වර්ණයෙන් යුක්ත විය.

1815 පෙබරවාරි 25දා බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් යටත් විජිත මහ ලේකම් වෙත යවන ලද අංක 95 දරන නිල ලිපියේ සඳහන් වන අතරම ඉංග්‍රීසින් සතු වූ එම සිංහ කොඩි 3 ක් හා ඉහත අල්ලා ගත් සියල්ල එංගලන්තයට යවන ලදි. එංගලන්තයේ කෞතුකාගාරයක් වු චෙල්සි යුද රෝහලේ ඔවුන් තැන්පත් කර තිබුනි. පසුව මෙම සිංහ



කොඩිය 1908 දී එකල ආණ්ඩුකාරයා වූ චාමර්ස් ට විරුද්ධ ව තොරතුරු ලියා එංගලන්ත රජය වෙත පෙත්සමක් සිය සපත්තුවේ සඟවාගෙන ගිය ඊ.ඩබ්ලිව්. පෙරේරා මහතා විසින් චෙල්සි රෝහලේ තිබී සොයා ගන්නා ලදී.

වර්තමාන ජාතික කොඩිය ඇරඹුම ඇති වන්නේ 1940 සමය වන විට ලංකාව තුළ අධිරාජ්‍ය විරෝධී සටන සමඟ ජාතික කොඩියක අවශ්‍යතාවය සමගිනි. 1948 පෙබරවාරි 16 දින මඩකලපු මන්ත්‍රී ඒ සිද්දි ලෙබ්බේ මහතා පාර්ලිමේන්තුවේදී එංගලන්තයට ගෙන ගිය සිංහ කොඩිය ජාතික කොඩිය ලෙස පිළිගත යුතු යැයි යෝජනා කරනු ලැබුවේ ය. එම යොජනාවත් එක්කම 1948 මාර්තු 06 වැනිදා එවකට අගමැති වු ඩී.එස්. සේනානායක මැතිතුමා විසින් නිල වශයෙන් ජාතික කොඩියක් සකස් කිරීම සදහා විශේෂ කමිටුවක් පත් කිරීමෙනි. 1948 එංගලන්තයෙන් නිදහස ලැබෙන විටත් අප පාවිච්චි කලේ පැරණි රාජකීය සිංහ ධජයයි. 1948 පෙබරචාරි 4 වැනිදා නිදහස ලැබු දිනයේ ඔසවනු ලැබුවේ ද මේ පැරණි ජාතික කොඩියයි.

එසේ පිහිට වු ජාතික කොඩිය පිළිබඳ කමිටුවේ සමාජිකයන් වුයේ එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා (සභාපති), ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා (ලේකම්), ශ්‍රීමත් ජෝන්.එල්. කොතලාවල මහතා, ජේ.ආර්. ජයවර්ධන මහතා, ආචාර්ය ලලිත් අභය රාජපක්ෂ මහතා, ටී.බී. ජයා මහතා, සෙනට් සභික එස්. නඩේසන් මහතා, කමිටුව තමන්ගේ අවසාන නිර්දේශය 1950 පෙබරවාරි 13 වෙනිදා පාර්ලිමේන්තුවට යෝජනා කර 1951 පෙබරවාරි27 වෙනිදා පාර්ලිමේන්තුවේ දී සභාගත කොට 1951 මාර්තු 02 වෙනිදා පාර්ලිමේන්තුවේ සභා සම්මත වී 1951 මාර්තු 31 වෙනිදා පැරණි පාර්ලිමේන්තුවේ ඉදිරිපිට ප්‍රධාන කොඩි ගසේ නිදහස් ශ්‍රී ලංකාවේ නව ජාතික කොඩිය ගරු අගමැතිතුමා වු ඩී.එස්. සේනානායක මහතා විසින් ඔසවන ලදි.

එය ප්‍රථම වරට නිදහස් උත්සවයකදී ඔසවනු ලැබුවේ 1952 පෙබරවාරී 4 වැනිදා යි. එම ප්‍රථම ජාතික කොඩියේ ප්‍රධාන ලක්ෂණය වූයේ පැරණි සිංහල ධජයට වම් පසින් කොළ හා රඹ පැහැ සිරස් පටි දෙකක් යා කොට එක් කිරීම හා ඒ පටි දෙක හා රතු සෘජුකෝනාශ්‍රය අතර කහ පටියක් ද මුලු කොඩිය වටේම කහ පාට පටි සිරස්ව හා තිරස්ව යෙදීමද සිදු විය. මෙම කොඩියේ කොළ හා තැඹිලි (රඹ) පැහැති සිරස් පටි සමාන පළලකින් යුක්තවීමයි. 1972 දී කොඩියේ රතු කොටුවේ මුළු හතරේ වූ කොත්(කේතු) සලකුණු හතර ඉවත් කර බෝපත් හැඩ 4 ක් එකතු කරමින්, එවකට රජයේ කලායතනයේ විදුහල්පතිවරයා වූ ජේ.ඩී.ඒ. පෙරේරා මහතා විසින් එහි චිත්‍ර නිර්මාණ භාරව කටයුතු කල අතරම කලාශූරී එස්. පී.චාල්ස් මහතාද එහි සහායක ලෙස කටයුතු කර ජාතික කොඩිය වෙනස්කම් කරන ලදි. 1972 මැයි 22 ලංකාව ජනරජයක් වූ දා ඔසවන ලද්දේ එසේ සකස් කළ ජාතික කොඩියයි.

1978 සැප්තැම්බර් මස 07 වැනිදා ප්‍රකාශ කල ජාතික කොඩිය හා ජාතික ගීය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ ද ප්‍රධාන කොටසකි. සමස්ත කොඩියේ තිරස් පළලට, මෙම එක් සිරස් පටියක පළල දරන අනුපාතය 1.7 වේ. එනම් මුළු කොඩියේ තිරස් පළල කොටස් 7ට බෙදු විට (කොළ පැහැති පටියට බාහිරව ඇති කහ පාට තිරස් පටියේ පළල කොටස අතහැර) 1/7 පළල ප්‍රමාණයක් තිරස් කොළ හා තැඹිලි පටිවල වෙන වෙනම තිබිය යුතු ය.

ප්‍රදර්ශනයට යොදා ගනු ලබන ජාතික කොඩිය, එහි සැලැස්ම,දිග පළල, වර්ණය ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය (SLS 693)1985 අංක දරණ ශ්‍රී ලංකා ජාතික කොඩිය සදහා වූ පොතක් මගින් නියම ප්‍රමාණ සහිතව සම්මතයන් ඉදිරිපත් කෙරිණි. එලෙසම 1986 අගෝස්තු මසදී ජාතික කොඩිය භාවිත කළ යුතු ආකාරය ගැන කරුණු සඳහන් රීති සංග්‍රහයක් ද අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කර ඇත.

## ජාතික කොඩියේ විවිධ වර්ණ ,කොටස් හා සංකේතවලින් නිරූපිත අදහස්

**01.කහ පාට සිංහයා** - සිංහල ජාතියත්, සිංහල ජනතාවගේ විනය ගරුකබව , නිර්භීතකම, අභිමානය නායකත්වය, සාධාරණත්වයත්, විදහා දක්වයි.

**02.කහ පැහැ අසිපත** - ධාර්මිකව ද නීත්‍යනුකූලව ද යුක්තිගරුකව ද රට පාලනය කරමින් මව් බිමේ ආරක්ෂාව උදෙසා නැගී සිටීම.

**03.බෝපත් හතර** - මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ ඇතුලූ සියලූ ආගම්වලට ගරු කිරීමේ උතුම් ගුණය.

**04.තද රතු/මෙරුන් පාට කොටස** - ශ්‍රී ලාංකික සියලූ ජනතාවගේ ජීව රුධිරය සහ පුරාණ සිංහල රාජකීය ධජයේ නියෝජනය.

**05.කොළ/හරිත හා තැඹිලි/රඹ පැහැ සිරස් පටි දෙක** - දෙමළ,මුස්ලිම්,බර්ගර්,මැලේ, ජා, වතු දෙමළ යනාදි සියලූ ජාතීන් නියෝජනය.

**06.එක සමාන පළලකින් වු කහ පටිය** - ජාතික කොඩියේ සියලූ කොටස් එකට බැදී තිබේ. සියලූ ජාතීන් අතර එකමුතුව. සාමය,ව ප්‍රඥාව හා අන්‍යෝන්‍ය අවබෝධය පැහැදිලි කරයි.

**07.සිංහයාගේ හිසේ කේශර හා වලිගයේ නැවුණු ඉහල කොටස** - මෙම කොටස් දෙක එක සමාන මට්ටමේ පැවතීමෙන් පාලකයා හා රටවැසියන් අතර සමානත්මතාව පැවතීම සහ මැදි පිලිවෙතට ගරු කිරිම.

අන්තර්ජාලය ඇසුරින් සැකසුම :

**තිළිණ අලහකෝන්**